# සෙසුනිළ උසස් කිරීමේ රෙගුලාසි

යුද හමුදාවට බඳවාගනු ලබන සෙසුනිළයෙකු හට ඔහුගේ කුසලතාවයන් හා අනෙකුත් හමුදාමයට කුසලතාවයන් මත බඳවා ගත් දින සිට අස්ව යන තෙක් හෝ විශ්‍රාම ගන්නා තෙක් එක් එක් නිළයන්ට උසස් වීම් ලබාදේ.

සෙසු නිළයින් හට උසස් වීම්/පත්වීම් ලබාදීම සඳහා යුහමු පිපඅම වෙතින් වරින් වර හමුදා නියෝග/ප්‍රතිපත්ති හා උපදෙස් නිකුත් කරනු ලබයි. එසේ නිකුත් කරන ලද හමුදා නියෝග/ප්‍රතිපත්ති හා උපදෙස් අතරින් දැනට ක්‍රියාත්මක වන හවනි/ප්‍රතිපත්ති හා උපදෙස් පහත සඳහන් පරිදි වේ. (මෙම නියෝග කුමන අවස්ථාවක හෝ සංශෝධනය කිරීමේ හැකියාව පිපඅම සතුව ඇත)

අ. හවනි 27/99 - සෙසුනිළ උසස් කිරීමේ රෙගුලාසි
ආ. හවනි 17/84 - උතුරු නැගෙනහිර ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරි කරන සෙසුනිළයින් උසස් කිරීමේ රෙගුලාසි
ඇ. අංක : පා/03/11/30 හා 1984.02.21 දින පිපඅම ලිපිය (ත්‍රස්ථවාදී ප්‍රහාර හේතුවෙන් මියයන සෙනින් උසස් කිරීම)
ඈ. අරෙසේ උසස් කිරීම් පිළිවෙත

සමස්ථ යුද හමුදාවේ (නිත්‍ය/ස්වේච්ඡා) සෙසුනිළයින්ගේ උසස් කිරීම් සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන හවනි 27/99 ට අනුව සෙසුනිළයෙකු උසස් කිරීමට ක්‍රියා කිරීමේදී පහත සඳහන් අවශ්‍යතා/සුදුසුකම් සම්පූර්ණ කල යුතුව ඇත.

අ. සංස්ථාවේ ඇබෑර්තු
ආ. හමුදා කාර්යක්ෂමතාවය (වෘත්තිය/තරු අනුව වර්ග කිරීම්/සේවා කාලය/උසස් කිරීමේ පරීක්ෂණ/භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණය)
ඇ. වෛද්‍ය වර්ග කිරීම්
ඈ. හමුදා හැසිරීම
ඉ. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය
ඊ. අනිගේ නිර්දේශය (වාරවා)

ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි යම් වෙනස් වීමක් වේනම් අවස්ථාවට උචිත පරිදි නිකුත් කරනු ලබන විශේෂ උපදෙස් වලට අනුව විය යුතුය.

**<u>සංස්ථාවේ ඇබෑර්තු:</u>**

යුද හමුදාවේ ආයතනයක/ඒකකයක සිටිය යුතු එක් එක් නිළයින්ගේ සංඛ්‍යාව දක්වා ඇති ලේඛණය (මෙය ලිපියක් විය හැකිය) සංස්ථාව යනුවෙන් හැඳින්වේ. එය යුහමු ප්‍රමාරාඅම වෙතින් අනුමත කරනු ලබන අතර, සමස්ථ යුද හමුදාවේ සියලුම ආයතන/ඒකකයන් වෙත එම ආයතනය/ඒකකයන් හි සිටිය යුතු එක් එක් නිළයින්ගේ සංඛ්‍යාව සඳහන් කර අනුමත කල සංස්ථාවක් ඇත. හවනි 27/99 ට අනුව සෙසුනිළයෙකු උසස් කිරීමේදී අදාල ආයතනයෙහි සංස්ථාව ඉක්මවා නොවන පරිදි උසස් වීම ලබාදීමට ක්‍රියාකල යුතුය.

**<u>හමුදා කාර්යක්ෂමතාවය:</u>**

වෘත්තිය තරු අනුව ප්‍රවීණතාවය :

හවනි 27/99 ට අනුව වෘත්තියක නියුතු වූවන් සහ වෘත්තියක නියුතු නොවූවන් සඳහා සපුරා තිබිය යුතු සුදුසුකම් පහත සඳහන් පරිදි වේ.

සාසෙ සිට ලාකෝ දක්වා - වෘත්තියක නියුතු වූවෙක් නම් ඔහුගේ වෘත්තියේ තුන්වන ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්විය යුතු අතර, වෘත්තියේ නුපුහුණු වූවෙක් නම් දෙවන තරුව සමත්වීම. (ශ්‍රීලයුපොහේබ අයවලුන් පළවන තරුව)

ලාකෝ සිට කෝප්‍රල් දක්වා - වෘත්තියක නියුතු වූවෙක් නම් ඔහුගේ වෘත්තියේ දෙවන ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්විය යුතු අතර, වෘත්තියේ නුපුහුණු වූවෙක් නම් තුන්වන තරුව සමත්වීම.

කෝප්‍රල් සිට සැරයන් දක්වා - වෘත්තියක නියුතු වූවෙක් නම් ඔහුගේ වෘත්තියේ පළවන ශ්‍රේණියේ පරීක්ෂණයෙන් සමත්විය යුතු අතර, වෘත්තියේ නුපුහුණු වූවෙක් නම් තුන්වන තරුව සමත්වීම.

**<u>සේවා කාලයඃ</u>**

හවනි 27/99 ට අනුව සෙසුනිළයෙකු උසස් කිරීමේ විභාගයට පෙනී සිටීම සඳහා සම්පූර්ණ කල යුතු සේවා කාලය පහත සඳහන් පරිදි වේ.

**රණ ඒකක : (ශ්‍රීලංසංබ හැර)**

සාසෙ සිට ලාකෝ දක්වා - විභාග දිනයේදී වසර 02 ක ගණනීය සේවා කාලයක් තිබිය යුතුය. (කාලය පිළිබඳ යෝග්‍යතාවය යුහමු විශේෂ අනුමැතිය මත මුදාහල හැක) (ශ්‍රීලයුපොහේබ අයවලුන් ඒකකය වෙත එක්වී මාස 06 කට පසු)

ලාකෝ සිට කෝප්‍රල් දක්වා - විභාග දිනයේදී වසර 04 ක ගණනීය සේවා කාලයක් තිබිය යුතුය. (ලාකෝ තනතුරේ වසර 01 ක සේවා කාලයක් සමග)

කෝප්‍රල් සිට සැරයන් දක්වා - විභාග දිනයේදී වසර 06 ක ගණනීය සේවා කාලයක් තිබිය යුතුය. (කෝප්‍රල් නිළයේ වසර 02 ක අවම සේවා කාලයක් සමග)

**සේවා ඒකක (ශ්‍රීලංසංබ ඇතුලුව)**

සාසෙ සිට ලාකෝ දක්වා - විභාග දිනයේදී වසර 03 ක ගණනීය සේවා කාලයක් තිබිය යුතුය. (ශ්‍රීලයුපොහේබ හැර) කාලය පිළිබඳ යෝග්‍යතාවය යුහමු විශේෂ අනුමැතිය මත මුදාහල හැක.

ලාකෝ සිට කෝප්‍රල් දක්වා - විභාග දිනයේදී වසර 05 ක ගණනීය සේවා කාලයක් තිබිය යුතුය. (ලාකෝ තනතුරේ වසර 02 ක අවම සේවා කාලයක් සමග)

කෝප්‍රල් සිට සැරයන් දක්වා - විභාග දිනයේදී වසර 09 ක ගණනීය සේවා කාලයක් තිබිය යුතුය.

නිත්‍ය කාන්තා බළකායේ වෘත්තිය ගත කර ඇති සෙබළියන්ගේ උසස් කිරීම් ක්‍රියාත්මක කිරීමේදී සේවා ඒකක සෙබළුන්ගේ උසස් කිරීම් සම්බන්ධයෙන් වූ පිළිවෙත අනුව සිදුකල යුතුයි.

ස්වේච්ඡා ඒකකවල වෘත්තිය ගත නොකරන ලද සෙබළ සෙබළියන්ගේ උසස් කිරීම් ඒකක පොදු ජ්‍යෙෂ්ඨතාවය මත සිදුකල යුතුය.

**<u>උසස් කිරීම් විභාගඃ</u>**

හවනි 27/99 හි ඇමුණුම අ, ආ සහ ඇ හි සඳහන් පරිදි ඒකක මට්ටමින් පැවැත්විය යුතුයි.

**<u>භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණයඃ</u>**

හවනි 27/99 ට අනුව ස්ථිර බල හමුදාවේ සේවා ඒකක අයවලුන් හා සංඥා බළකායට අයත් සෙනින් කෝප්‍රල් සිට සැරයන් දක්වා උසස් කිරීමේදී පූර්ව සුදුසුකමක් වශයෙන් භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතුය. එම ඒකකවල පහත සඳහන් වෘත්තින්ට අයත් සෙනින් භෝජනාගාර ගිණුම් තැබීමෙන් මුදාහැර ඇත.

අ. කම්මල්කරු
ආ. වඩුකාර්මික/පුරුද්දන්නා
ඇ. රිය පෙට්ටි හා රිය කුඩු සාදන්නා
ඈ. පින්තාරුකරු
ඉ. වැද්දුම්කරු
ඊ. පාවහන් අලුත්වැඩියා කරන්නා
උ. සන්නාලියා (ඇඳුම් මසන්න)
ඌ. උපකරණ අලුත්වැඩියා කරන්නා
එ. අරක්කැමියා
ඒ. සතුන් මරන්නා
ඔ. ලෝහ තහඩු වැඩකරු
ඕ. පෙදරේරු
ක. රියදුරු
ග. තූර්ය වාදක
ච. බක්කරේ (දැවකැම්)

තවද ශ්‍රීලසසබ, ශ්‍රීලකාහ වැනි ඒකක වල වෘත්තියගත කර ඇති එහෙත් ඉහත වෘත්තින්ට අයත් නොවන සමහර වෘත්තින්ට අයත් සෙනින් හා ස්වේච්ඡා බලසේනාවේ සමහර ඒකක වල වෘත්තිය ගත නොකරන ලද සෙනින්ද කෝප්‍රල් සිට සැරයන් දක්වා උසස් කිරීමේදී භෝජනාගාර ගිණුම් තැබීමේ පරීක්ෂණයෙන් අනිවාර්යයෙන්ම සමත් විය යුතුය.

**<u>වෛද්‍ය වර්ග කිරීම</u>**

එෆ්ඊ ට වඩා අඩු වෛද්‍ය වර්ග කිරීමක් ඇති අයවලුන් වෛසේඅම නිර්දේශය සහිතව පිපඅම පූර්ව අනුමැතියකින් තොරව උසස් කල නොහැක. කෙසේ වෙතත් දැනට පවතින උපදෙස් වලට අනුව ත්‍රස්ථවාදී ප්‍රහාරයන්ගෙන් තුවාල ලබා ආබාධිතව පහත් වෛද්‍ය වර්ග කිරීම් මත සිටින සෙසුනිළයින් හැර වෙනත් වෛද්‍ය හේතූන් මත පහත් වෛද්‍ය වර්ග කිරීම් මත සිටින කිසිදු සෙසුනිළයෙකු උසස් කිරීම සඳහා වෛසේඅම නිර්දේශය හෝ පිපඅම අනුමැතිය ලබා නොදෙනු ඇත. (අංක ඃ වෛසේ/වෛද්‍ය/24/2003 (26) හා 2003.09.30 දිනැති වෛසේඅම ලිපිය)

**<u>හමුදා හැසිරීම</u>**

සෙසුනිළයෙකු කිසියම් නිළයකට උසස් කිරීමේදී ඔහුගේ චරිතය ඉතා උසස් මට්ටමක පැවතිය යුතුය. මේ සඳහා යහපත් පැවැත්මේ වැටුප් ලබමින් සිටිය යුතුයි. කෙසේ වෙතත් යහපත්

පැවැත්මේ ලාංඡණ සම්බන්ධව ඇති හචනි 25/82 හි දක්වා ඇති පරිදි යම් කාලයක් සඳහා පුද්ගලයෙකුගේ යහපත් පැවැත්මේ ලාංඡණ අහිමිවීම ගැන නොසලකා ඔහු තවදුරටත් පහත් වර්ගයක යහපත් පැවැත්මේ වැටුප් ලබමින් සිටියදී සිදුකර ඇති වරද පිළිබඳව හචනි 25/82 හි දක්වා ඇති කාලසීමාව අවසානයේ හෝ දඬුවම ලද දින සිට වසර 1 කට පසුව හෝ මේ දෙකෙන් අඩු කාලසීමාව අවසන් වූ විට සෙබළෙක් උසස් කිරීමට සලකා බැලිය හැකිය. කෙසේ වෙතත් අවුරුදු 1 ක්වූ අවම කාලසීමාව තුලදී හෝ හචනි 25/82 හි සඳහන් ඊට අඩු කාලසීමාව තුලදී සෙසුනිළයාගේ හැසිරීම ඉතා යහපත් බවට වර්ග කර තිබිය යුතුයි.

තවද 3 වන හා 4 වන හා 5 වන ලාංඡණය අහිමි වූ පුද්ගලයෙකු සම්බන්ධයෙන් වන විට ඉහත සීමා කිරීමේ කාලය දෙගුණයක් වන අතර, එවිට උපරිම කාලය අවුරුදු 02 ක් ඉක්ම නොයයි.

**<u>රාජ්‍ය භාෂා ප්‍රවීණතාවයः</u>**

සෙසුනිළයෙකු උසස් කිරීම සඳහා නිර්දේශ කරන විට සිංහලෙන් කණිෂ්ඨය සමත්ව සිටිය යුතුය. ඉංග්‍රීසියෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් යම් පුද්ගලයෙකු කණිෂ්ඨය සමත්වී සිටියද ඔහු ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන රාජ්‍ය භාෂා ප්‍රවීණතා 3 වන පංතියට පෙනී සිට ඉන් සමත්විය යුතුය.

කෙසේ වෙතත් දැනට පවතින උපදෙස් අනුව සෙසුනිළයෙකු සිංහල මාධ්‍යයෙන් 8 ශ්‍රේණිය සමත්වීම රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය මත සලකනු ලැබේ. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය යුහමු, පිපඅම අනුමැතිය මත මුදාහල හැක.

උදාඃ (1999.07.14 දින දක්වා පාබල ඒකක බඳවා ගත් 5 වන ශ්‍රේණිය සමත් සෙනින් උසස් කිරීම සඳහා රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නොසලකා ක්‍රියා කරන ලෙස පිපඅම වෙතින් උපදෙස් ලබාදී ඇත. පා/03/10 හා 1999.07.26 දිනැති පිපඅම ලිපිය)

**<u>අනිගේ නිර්දේශයः</u>**

ලාකෝ නිළයෙන් පසුව උසස් කිරීම් ක්‍රියාත්මක කිරීම/නිර්දේශ කිරීම සඳහා අනි විසින් යුආපා 45 හෝ 46 මගින් උසස් කිරීම පිළිබඳව නිර්දේශ වාරවාහි ඇතුලත් කල යුතුය.

**<u>උසස් කිරීම් අනුමත කිරීමේ බලයः</u>**

සෙසුනිළයෙකු උසස් කිරීමේ බලය පහත් සඳහන් පරිදි වේ.

අ. සියලුම ඒකකවල ලාකෝ සිට සැරයන් දක්වා උසස් කිරීමේ අනුමැතිය ඒකක අනි සතුය.

ආ. මා/සැ නිළයේ සිට බනි 1 නිළය දක්වා උසස් කිරීමේදී ඒකක අනි විසින් නිර්දේශ ඉදිරිපත් කල යුතු අතර, රෙජිමේන්තු අධිපති/බළකාධිපති අනුමත කරනු ලැබේ.

**<u>උසස් කිරීමේදී පසු දිනයන් යෙදීම</u>**

සෙසුනිළයින්ගේ උසස් කිරීමක්/පත්කිරීම් පසුදිනයක සිට බලපාන සේ යෙදීම/ක්‍රියාත්මක වන දිනය පිළිබඳ බලය පහත සඳහන් පරිදි වේ.

අ. මාස 03 ක් ඇතුලත උසස් කිරීම්/පත්කිරීම් ක්‍රියාත්මක කිරීම ඒකක අනි විසින්.

ආ. මාස 03 ට වැඩි සහ මාස 06 ක් දක්වා උසස් කිරීම්/පත්කිරීම් ක්‍රියාත්මක කිරීම සඳහා රෙජිමේන්තු අධිපති/බළකාධිපතිගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුයි.

ඇ. මාස 06 ට වැඩි සහ මාස 12 ට අඩු දිනයක සිට ක්‍රියාත්මක කල යුතු උසස් කිරීම්/පත්කිරීම් සම්බන්ධයෙන් සේනාංකාධිපති, හකාස අණසක ආඥාපතිගේ පූර්ව

අනුමැතිය ලබාගත යුතුයි. (සේවා ඒකකයන්ට අයත් සෙසුනිළයින් සම්බන්ධයෙන් වන විට භකාස අණසක ආඥාපතිගේ අනුමැතිය ලබාගත යුතුය)

ඇ. මාස 12 ඉක්මවූ දිනයක සිට ක්‍රියාත්මක කල යුතු සෑම උසස් කිරීමක් සැබැඳිව පිපඅම අනුමැතිය ලබාගත යුතුයි.

**<u>අභිබවනයः</u>**

එකම නිළයේ ජ්‍යෙෂ්ඨ ලෙස ඉහල නිළයකට උසස් කිරීම සඳහා සම්පූර්ණ සුදුසුකම් නොමැති වූ විටක හෝ අනි විසින් ඊලග නිළය ඉහල නිළයට උසස් කිරීම සඳහා නිර්දේශ නොකරනු ලැබූ විට එම නිළයේ කණිෂ්ඨයෙකු විසින් ජ්‍යෙෂ්ඨයා පසුකරමින් ඉහල නිළයට උසස් වීම අභිබවනය ලෙස හඳුන්වයි. කිසියම් නිළයකට උසස් කිරීම සඳහා සෙසුනිළයෙකු අභිබවනය කිරීමේදී එසේ කිරීමට හේතු වූ කරුණු පිළිබඳව සම්පූර්ණ වාර්ථාවක් පිපඅම වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතුය. තවද අභිබවනයට ලක්වන පුද්ගලයා පිළිබඳව විශේෂ රහස්‍ය වාර්ථාවක් ඔහු විසින් දුටු බවට අත්සන් කිරීමෙන් පසු පුද්ගලික ලිපිගොනුව සමග ඉදිරිපත් කල යුතුයි.

උසස් කිරීමේ විභාගයෙන් නැවත නැවත අසමත්වීම කොනොනියෙකු ස්ථිර වශයෙන්ම (අනිවාර්යයෙන්ම) අභිබවනය කිරීමට හේතු විය හැක. කෝප්‍රල් සිට සැරයන් දක්වා උසස් කිරීමේ විභාගයෙන් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරක් තාවකාලික අභිබවනය සිදුකල හැකි අතර, එසේ තාවකාලික අභිබවනය වූවන් ඊලගට පැවැත්වෙන පරීක්ෂණයෙන් සමත්විය යුතු අතර, එම පරීක්ෂණයෙන්ද අසමත් වීමේ ප්‍රතිඵලය ස්ථිර අභිබවනය වේ.

**<u>ජ්‍යෙෂ්ඨතාවය නිගමනය කිරීමः</u>**

සෙසුනිළයන් ස්ථිර හෝ තාවකාලික නිළයට උසස් කල හැක.

අ. එකම නිළයේ තාවකාලික නිළය උසුලන අයවලුන්ට වඩා ස්ථිර නිළ උසුලන අයවලුන් ජ්‍යෙෂ්ඨ විය යුතුයි.

ආ. එකම ස්ථිර නිළය උසුලන අයවලුන් අතර ජ්‍යෙෂ්ඨතාවය නිගමනය කල යුත්තේ මෙම නිළය ස්ථිර කරනු ලැබූ දිනය අනුවයි.

ඇ. එකම දිනයක නිළයන් ස්ථිර කර ඇත්නම් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවය පැහැදිලිව සඳහන් කර නොමැති අවස්ථාවක ජ්‍යෙෂ්ඨතාවය නිගමනය කල යුත්තේ ඊලග පහල නිළයේ ජ්‍යෙෂ්ඨතවය අනුවය.

ඈ. සෙසුනිළයින් එකම තාවකාලික නිළයේ වූ විට ජ්‍යෙෂ්ඨතාවය රඳා පැවතිය යුත්තේ එය පැහැදිලිව දැක්විය හැකි ඊලග පහල නිළයේ ජ්‍යෙෂ්ඨතාවය අනුව විය යුතුය.

**<u>අරෙසේ මත උසස් කිරීම්/පත්කිරීම්:</u>**

අරෙසේ මත උසස් කිරීමක් යනු සේවා කාලයට පමණක් සීමාවන අයුරින් කරනු ලබන උසස් කිරීම් වේ. මෙම උසස් කිරීම් විශේෂයෙන් ක්‍රියාත්මක කරනු ලබන්නේ සමස්ථ යුධ හමුදාවට අයත් පොදු ආයතනවලයි. යුහමු අරෙසේ කාලසීමාව අවුරුදු 02 ක් වන අතර, සෙසු ආයතනවල අවුරුදු 3 කි.

යම් ස්ථානයකට අරෙසේ මත ඇතුලත් කිරීමට නියමිත පුද්ගලයෙකු යුහමු පිපඅම වෙතින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තෝරා ගැනීමෙන් පසු අදාල ස්ථානය වෙත ඇතුලත් කිරීම්/පත්කිරීම් නියෝග පලකරනු ලැබේ. ඒ අනුව අදාල අය තමන් තේරී පත්වූ අරෙසේ ස්ථානය වෙත රාජකාරි සඳහා රපෝර්තු කල යුතුය. එසේ රපෝර්තු කිරීමෙන් පසු සෙබළාගේ මව් ඒකකය වෙතින් මෙම අරෙසේ ඇතුලත් කිරීම යුආපා 09 මගින් පලකල යුතුය.

එම යුආපා 09 දෙකොනි මගින් පලවිය යුතු අතර, අනතුරුව සෙබළා සේවය කරන අරෙසේ ස්ථානය වෙතින් ඔහු ඊලග නිළයට උසස් කිරීම පිළිබඳව නිර්දේශ සෙබළාගේ මව් ඒකකය වෙත ඉදිරිපත් කල යුතු අතර, එසේ නොකරන තෙක් මව් ඒකකයට අදාල අයගේ උසස් කිරීම ක්‍රියාත්මක කල නොහැක. එසේ නිර්දේශ ඉදිරිපත් කරන විට සෙබළා විසින් උසස් කිරීමට අවශ්‍ය ලිඛිත ප්‍රකාශණ 03 ක් ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත් අරෙසේ උසස් කිරීමක් ලබාගත හැක්කේ අරෙසේ මත ඇතුලත් කරන සෙබළා දරමින් සිටින නිළයට ඉහල නිළයක ඇබෑර්තුවක් සඳහා ඇතුලත් කල අවස්ථාවකදී පමණි.

අරෙසේ මත උසස් කල අයෙකු තම සේවා කාලය අවසන් වී ඒකකයට රපෝර්තු කල විගස ඒ බව යුආපා 09 මගින් පලකල යුතුය. ඒ අනුව අරෙසේ කාලසීමාවට පමණක් උසුලන ලද නිළය අහෝසි විය යුතුය. යම් අවස්ථාවකදී ඔහුගේ අරෙසේ කාලසීමාව තුළ ඒකක සංස්ථාවෙහි ඇබෑර්තු ඇතිවූ විට ඔහු ඒකක සංස්ථාව මත උසස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ඒකකය සතු වගකීමකි. ඒ වන විට අදාල සෙනි හවනි 27/99 අනුව සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතුය. එසේ ඒකක සංස්ථාව මත උසස් කිරීමට ඇබෑර්තු නැතිවිට හෝ අනෙකුත් සුදුසුකම් සපුරා නොමැති වූ විටකදී වුවද ඒකක අනි එකග වන්නේ නම් අරෙසේ නිළයෙන්ම ඒකකයේ රඳවා ගැනීමට පුළුවන. (එහෙත් එම නිළයට සරිලන වැටුප් නොලැබේ)